ක්‍රියාකාරකම 2.5.1. තේමාවක් ඔස්සේ පරිකල්පනය මෙහෙයවමු.

පරිකල්පනය යනු - "සිතීම"නොමැතිනම් "සිතා බැලීම" ලෙස සරළ ලෙස අර්ත දැක්විය හැක. එලෙස සරළලෙස විග්‍රහ කලද පරිකලපනය යන්න සංකීර්ණ දෙයක් ලෙස විද්වත් මතය වේ. මානව පරිකල්පනය නිසා ලොවට දායද වූ දෑ බොහොය.විද්‍යාව,නව සොයාගැනීම්,කලා නිර්මාණ වැනි විවිධ ක්ෂේත්‍ර ඔස්සේ අපට සාදක සහිතව පරිකල්පනය පිළිබඳව පෙන්වාදිය හැකිය.

පරිකල්පනය යනු - තවදුරටත් සිතා බැලීම නොවේද ? මෙම ප්‍රශ්නයට මීට පෙර ඔබ විසින් සිදුකරන ලද පැවරුම් දෙකන් පිළිතුරු ලැබෙන්නට ඇත.
එනම් පරිකල්පනය යනු සාමාන්‍ය සිතා බැලීම නොව , කිසියම් දෙයක් විෂයෙහි තවදුරටත් සොයා බැලීම වේ. කාලා මාධ්‍යක් ලෙස නාට්‍ය හා රංග කලාව හදාරන ඔබ විසින් පුහුණු කලයුත්තේ එයයි.නරඹන නාට්‍යක්,සිනමා නිර්මාණයක්,රසවිඳින ගීතයක් ,චිත්‍රයක ඇති සැඟවනු අර්ථය,යටිපෙළ අරුත් එකවර ග්‍රහනය කර ගැනීමට පරිකල්පනය පුහුනු කිරීම මගින් හැකියා ලැබෙනු ඇත.

නළුවෙක් ලෙස - නළුවෙකුට පරිකල්පනය අත්‍යවශ්‍ය දෙයකි.තමාට ලැබෙන නාට්‍ය පිටපත කියවා බලමින්, එහි චරිත ස්වභාවයන් හඳුනාගනිමින්,දෙබස්වල ඇති ගැඹුර වටහා ගනිමින් නිවැරදි අර්ථය සහිත උච්ඡාරනය සිදු කරමින් තම රංගන කාර්යය සිදුකිරීමට පරිකල්පනය උපකාරීවේ.

පරිකල්පනය යනු සාපේක්ෂ දෙයකි. එනම් පුද්ගලයාගෙන් පුද්ගලයාට පරිකල්පනය වෙනස් වේ.
ක්‍රියාකාරකම .

පරිකල්පනය පුද්ගලයාගෙන් පුද්ගලයාට වෙනස් වෙන ආකාරය සොයා බැලීමට ක්‍රියාකාරකමක් පරිකල්පන 1 පැවරුම් පත්‍රිකාවේ ඇති රූප රාමු වෙනත් කලා විෂයන් හදාරන ඔබගේ මිතුරෙකුට පෙන්වා කරුණු විමසන්න.වෙනත් විෂයක් උගන්වන ගුරුවරයෙකුට පෙන්වා කරුණු විමසන්න.වැඩිහිටියෙකුට පෙන්වා කරුණු විමසන්න. එකම ඡායාරූපයට ඔවුන්ගෙන් ලැබෙන අදහස් සටහන් කරගන්න.

- එකම නිර්මාණය කෙරෙහි ඒ ඒ පුද්ගල පරිකල්පනය වෙනස් වන බව ඔබට පැහැදිලිවේ.
- පාසල් සිසුවෙකු ලෙස පරිකල්පනය දියුණු කිරීමේ වැදගත් කම පැහැදිලිවේ.
- පරිකල්පනය සංවර්ධනය කිරීම සඳහා නිර්මාණ රසවිඳීම පුරුද්දක් කර ගන්න.
- රසවිඳින ලද නිර්මාණය පිළිබඳ සමූහ සාකච්ඡා සිදු කිරීම මගින් පරිකල්පනය වර්ධනය වේ.
- නිර්මාණ පිළිබඳ විචාර මත සහිත සටහන් කියවන්න.
    - ❖ මෙම ක්‍රියාකාරකම් පාඩමට පමණක් සීමා නොකර නිතර නිතර සිදු කිරීම මගින් ඔබගේ පරිකල්පනය සංවර්ධනය වේ.